IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2014/2015**

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2017 මැයි)**

# BLE 309 - ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය

අයදුම්කරුවන්ට උපදෙස් :

**(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01) i) වෙළඳපොළ සංකේන්ද්‍රිත ආර්ථික ක්‍රමයෙහි ක්‍රමවේදය පහදා එම ක්‍රමයෙහි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii) වෙළඳපොළ සංකේන්ද්‍රිත ආර්ථික ක්‍රමය අසාර්ථක වීමට කුමන හේතු බලපාන්නේදැයි විස්තර කරන්න.

(ලකුණු 05)

iii) මූල්‍ය ප්‍රතිපත්තිය හා බදු ප්‍රතිපත්තිය අතර පවත්වාගතයුතු සම්බන්ධය කෙබඳු දැයි විග්‍රහ කරන්න.

(ලකුණු 05)

iv) හැකිලෙනසුළු බදු ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව තුල කෙසේ ක්‍රියාත්මක කලහැකිද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02) i) විනිමය පාලනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii) රටක ජාතික ආදායම් වෙනස් වීම විදේශ විනිමය ඉල්ලුමට හා සැපයුමට බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 07)

iii) විනිමය අනුපාත ප්‍රතිප්‍රමානය වීම සිදුවිය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

03) i) ශ්‍රී ලංකාව තුල උද්ධමනයක් පැවැතීම රටේ මහජනතාවට ඇති කරන බලපෑම් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii) පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් ශ්‍රී ලංකාව තුල ඇතිවීමට බලපාන කාරණා මොනවාද?

(ලකුණු 06)

iii) උද්ධමනය පාලනය සඳහා ශ්‍රී ලංකාවේ රජයන් විසින් අනුගමනය කල දිගුකාලීන හා කෙටිකාලීන පියවර මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04) i) ශ්‍රී ලංකා ගෙවුම් ශේෂ ලේඛණයේ වර්තන/ ජංගම (Current) ගිණුම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii) ගෙවුම් ශේෂ ලේඛණයේ හිඟයක් ඇතිවිට ඊට මුහුණ දීමට ශ්‍රී ලංකාවේ රජයන් විසින් ගෙන ඇති පියවර මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

iii) ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන ලබාගැනීමට හේතුවන කාරණා මොනවාද? වර්තමානයේ ජාත්‍යන්තර ඍජු විදේශ ආයෝජන වල ප්‍රවනතාව කුමක්ද?

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

05) i) ගෝලීයකරණයෙන් ලබාගතහැකි වාසි පිළිබඳව පැහැදිලි කර ගෝලීයකරණයේ නව ප්‍රවනතා ශ්‍රී ලංකාවට කෙසේ බලපානු ඇත්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii) අපනයන දිරිගැන්වීම හා ආනයන ආදේශනය නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති මෑත කාලීන පියවර පිළිබඳ පැහැදිලි කරන්න.

(ලකුණු 07)

iii) ආනයන ආදේශනය කිරීමේ අවශ්‍යතාවය සහ ඉන් ලබාගතහැකි වාසි ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06) i) ශ්‍රී ලංකාවේ මෑත කාලීන අපනයන හා ආනයන තත්වයන් පැහැදිලි කොට ඉන් ආර්ථිකයට සිදුවිය හැකි බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii) දුප්පත්කම යනු කුමක්දැයි පහදා දුප්පත්කම නිසා පුද්ගලයින්ට මුහුණ දීමට සිදුවන තත්වයන් ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii) දිළිඳුකමේ විෂම චක්‍රයෙන් ගැලවීම සඳහා ගතහැකි සහ ගෙන තිබෙන පියවර මොනවාදැයි ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

07) i) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා තිරසාර සංවර්ධනය තිරණය කරන සාධක මොනවාද?

(ලකුණු 08)

ii) ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටක ආර්ථික වර්ධනයක තිබිය යුතු ලක්ෂණ මොනවාද?

(ලකුණු 05)

iii) ආතර් ලුවිස් ගේ ද්විත්ව ආර්ථික න්‍යායට අනුව ග්‍රාමීය අංශයේ සහ නාගරික අංශයේ දැකිය හැකි ලක්ෂණ ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

08) i) කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) හා ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) අතර පවතින වෙනස්කම් විස්තර කරන්න.

(ලකුණු 10)

ii) සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින් විසින් සහ නව සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින් විසින් පැහැදිලි කල රටක ආර්ථික වර්ධනය අත්කර ගැනීම සඳහා අනුගමනය කලයුතු කරුණු සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)